# වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම

**කිසියම් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක ජීවත් වන පුරවැසියන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට අදාළ සභාව සතු වාහන සහ යන්ත්‍රෝපකරණ කුලියට දෙනු ලැබේ.**

**එම පහසුකම ලබා ගන්නේ කෙසේ ද?**

**01** වාහනය හෝ යන්ත්‍රය ලබා ගත හැකි පහසු දිනය, වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයට පැමිණ දැන ගෙන, ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර පෙරටු කාර්යාලයට බාර දෙන්න.

**02** ඉල්ලුම් පත්‍රය බාර ගෙන පෙරටු කාර්යාලය විසින් ඔබට පසු විපරම් අංකයක් නිකුත් කරනු ඇත.

**03** ඔබගේ ඉල්ලීම එදින ම තාක්ෂණ නිලධාරීට යොමු කරන අතර අය කර ගත යුතු ගාස්තුව සහ ආරක්ෂිත ඇප මුදලේ ප්‍රමාණය, ඔහු විසින් ඉංජිනේරු / ලේකම් වෙත යොමු කරනු ඇත.

**04** අනුමතය ලද දින ම ගාස්තු සහ ආරක්ෂිත ඇප මුදල් ගෙවීම පිළිබඳ ව ඉල්ලුම්කරුට දැනුම් දෙයි.

**05** අන්තර්ජාලය මගින් හෝ පෙරටු කාර්යාලයට පැමිණ ආරක්ෂිත ඇප මුදල සහ ගාස්තුව තැන්පත් කළ පසු ඊට ලදුපතක් හා රියදුරාට / යන්ත්‍ර ක්‍රියාකරුට කාර්ය පැවරූ ලිපියේ ඔබගේ පිටපත ද ඔබට ලැබෙනු ඇත.

**06** ඒ අනුව රියදුරු / යන්ත්‍ර ක්‍රියාකරු පැමිණ එම කාර්යය කරනු ලබන අතර අදාළ දිනයේ ඒ ස්ථානයේ දී ම කාර්ය ඉටු කළ බව හෝ නොකළ බව ඉල්ලුම්කරු විසින් තහවුරු කළ යුතු ය.

**07** අදාළ කාර්යය නිම කළ බව හෝ නොහැකි වූ බව රියදුරු / යන්ත්‍ර ක්‍රියාකරු විසින් තාක්ෂණ නිලධාරීට වාර්තා කරනු ඇත.

**08** රියදුරාගේ / යන්ත්‍ර ක්‍රියාකරුගේ වාර්තාව අනුව අය කර ගත යුතු ගාස්තුව සහ ආපසු ගෙවිය යුතු ආරක්ෂිත ඇප තැන්පත් ප්‍රමාණය පිළිබඳ ව නිර්දේශය තාක්ෂණ නිලධාරී විසින් ලබා දෙයි.

**09** කාර්යය අවසානයේ යම් ඉතිරි මුදලක් වේ නම්, ඒ සඳහා චෙක්පතක් ඉංජිනේරුගේ / ලේකම්ගේ අනුමතය මත ඔබට ගෙවනු ඇත.